පිළියන්දල අධ්‍යාපන කලාපය
**Education Zone - Piliyandala**

වර්ෂ මැද ඇගයීම - 2017
**Mid Year Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade } 08 | විෂයය Subject } බුද්ධ ධර්මය | පත්‍රය Paper } I | කාලය Time } පැය 02යි |

නම ...............................................

විභාග අංකය .......................

සැළකිය යුතුයි:

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්න වලදී දී ඇති පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
යන කවිය ඇතුළත් ගුත්තිල කාව්‍ය රචනා කළේ,

1. වීදාගම මෛත්‍රීය හිමි ය.
2. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය.
3. වෑත්තෑවේ හිමි ය.
4. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි ය.

02) දේවදත්ත කුමාරයා සමග පැවිදි බවට පත් වූ කුමාරයකු නොවන්නේ,

1. අනුරුද්ධ ය.
2. නන්ද ය.
3. කිම්බිල ය.
4. භගු ය.

03) ගරු ධර්ම අට පිළිගැනීමෙන් පසු පැවිද්ද ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කළේ,

1. විශාඛා සිටු දේවිය යි.
2. යසෝදරා දේවිය යි.
3. සුමනා දේවිය යි.
4. මහා ප්‍රජාපති ගෝතමී දේවිය යි.

04) බුදුරජාණන් වහන්සේ දිව්‍ය ලෝකයට කැඳවාගෙන ගොස් දිව්‍යාංගනාවන් දැකීමට සැලැස්වූයේ,

1. නන්ද කුමරු ට.
2. භද්දිය කුමරුට ය.
3. ආනන්ද කුමරුට ය.
4. භගු කුමරුට ය.

05) පිරිනිවන් මංචකයේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණියේ,

1. සෝණදන්ඩ බමුණා ය.
2. පොට්ඨපාද බමුණා ය.
3. සංජය පිරිවැජියා ය
4. සුභද්‍ර පිරිවැජියා ය.

06) භික්ෂූන් වහන්සේට අවශ්‍ය වැසි සළු, ගිලන් බෙහෙත්, ආගන්තුක බත්, ආදිය අනුදැන වදාලේ විශාඛාවන් විසින් කරන ලද ඉල්ලීමට අනුව බව සඳහන් වන විනය ග්‍රන්ථය වනුයේ,

1. පරාජික පාලි
2. පාචිත්තිය පාලි
3. චුල්ලවග්ග පාලි
4. මහාවග්ග පාලි

07) අප බෝධි සත්ත්වයන් වහන්සේ බුද්ධත්වය ලැබුවේ වයස,

1. අවුරුදු තිස් හතරේදී ය.
2. අවුරුදු තිස් පහේදී ය.
3. අවුරුදු තිස් හයේදී ය.
4. අවුරුදු තිස් හතේදී ය.

08) තමාගේ වෙනත් කටයුතු සියල්ල පසෙකින් තබා සිතට නගා ගැනීමට සුදුසු බැවින් ධර්මය,

1. සන්දිට්ඨිකෝ නම් වේ.
2. අකාලිකෝ නම් වේ.
3. ඒහිපස්සිකො නම් වේ.
4. ඕපනයිකෝ නම් වේ.

09) පිරිත් දේශනාවකදි පිරිත් මණ්ඩපය තුළ තැන්පත් කිරිම සඳහා වැඩමවනු ලබනුයේ,

1. සංධාතුක කරඬුව සහ බුදු පිළිම වහන්සේ ය.
2. බුදු පිළිම වහන්සේ සහ පිරුවනා පොත් වහන්සේ ය.
3. සධාතුක කරඬුව සහ පිරුවානා පොත් වහන්සේ ය.
4. පුන්කලස් සහ පිරුවානා පොත් වහන්සේය.

10) සමථ භාවනාවට අයත් දස අනුස්සති අතර පළමුව දැක්වනුයේ,

1. සීලානුස්සති
2. ධම්මානුස්සති
3. සංඝානුස්සති
4. බුද්ධානුස්සති

11) අස්සජි මහරහතන් වහන්සේ කෙටියෙන් දේශනා කළ ධර්මය අසා සෝවාන් ඵලයට පත් වුයේ,

1. සංජය පිරිවැජියා ය.
2. උපක ආජීවකයා ය.
3. උපතිස්ස පිරිවැජියා ය.
4. කෝලිත පිරිවැජියා ය.

12) භාරත දේශයට අධිරජ වූ චන්ඩාශෝක රජු , ධර්මාශෝක මහා අධිරාජයාණන් බවට පරිවර්තනය කළේ,

1. සුමන සාමණේරයන් ය.
2. නිග්‍රෝධ සාමණේරයන් ය.
3. රාහුල සාමණේරයන් ය.
4. නන්ද සාමණේරයන් ය.

13) බ්‍රහ්මචරියාව යනු,

1. බ්‍රහ්මයින්ගේ හැසිරීමය.
2. අලසව හැසිරිමය.
3. උතුම්, ශ්‍රේෂ්ඨ හැසිරීමය.
4. සාමාන්‍ය හැසිරීමය.

14) බුදුරජාණන් වහන්සේ වැඩසිටි රජගහනුවර පිහිටි ලෙහෙනුන්ගේ අභය භූමියක් වූ "කලන්දක නිවාප" යනුවෙන් හඳුන්වන්නේ,

1. නිග්‍රෝධාරාමය යි.
2. වේළුවනාරාමය යි.
3. පූර්වාරාමය යි.
4. ඝෝෂිතාරාමය යි.

15) ජාතක පොත් වහන්සේ ලියැවුණු යුගය වනුයේ ,

1. දඹදෙනි යුගය ය.
2. කුරුණෑගල යුගය ය.
3. කෝට්ටේ යුගය ය.
4. මහනුවර යුගය ය.

16) නිගණ්ඨනාථපුත්තයන්ගේ ප්‍රධාන දායකයා වූයේ,

1. සුමන මාලාකරු ය. 2. සිඟාලක ගෘහපති පුත්‍රයා ය.
3. සුභ මානවකයා ය. 4. උපාලි ගෘහපති පුත්‍රයා ය.

17) පැරණි බෞද්ධයන් කල ආගමික චාරිත්‍රයක් වනුයේ,

1. බෝධිපූජා පැවැත්වීම ය.
2. බුද්ධ පූජා පැවැත්වීම ය.
3. ආරියවංශ ධර්ම දේශනා පැවැත්වීම ය.
4. වෙහෙර විහාර ඉදිකිරීමය.

18) බුදු දහමට අනුව ව්‍යාධි දුක යනු,

1. ඉපදීම ය. 2. මරණයට පත්වීම ය.
3. ජරාවට පත්වීමය ය. 4. රෝගී වීම ය.

19) සත්ත්වයාගේ මරණය සිදුවන ආකාර හතරට අයත් නොවන්නේ,

1. කම්මක්ඛය ය.
2. ආචිණ්ණය ය.
3. උභයක්ඛ ය.
4. උපච්ඡේදක ය.

20) සත්ත්වයා භවයෙන් භවයට ගමන් කරන සදාකාලික ආත්මයක් නැත, එබැවින් මතු උපතක් ද නැත, යන විභව තණ්හාව ඇති වීමට මුල් වනුයේ,

1. ශාස්වත දෘෂ්ටිය තුළිනි 2. සම්මා දෘෂ්ටිය තුළිනි
3. උච්ඡේද දෘෂ්ටිය තුළිනි 4. මිථ්‍යා දෘෂ්ටිය තුළිනි

| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>Education Zone - Piliyandala | | | |
|---|---|---|---|
| වර්ෂ මැද ඇගයීම - 2017<br>Mid Year Evaluation | | | |
| ශ්‍රේණිය<br>Grade } 08 | විෂයය<br>Subject } බුද්ධ ධර්මය | පත්‍රය<br>Paper } II | |

නම .............................................. විභාග අංකය ......................

සැළකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- 2, 3, 4, 5, 6, 7 යන ප්‍රශ්න වලින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.

01) ඔබේ පන්තියේ බුද්ධ ධර්ම විෂයට අදාළ දෙවන වාරයේ සිදු කළ " ප්‍රශ්නෝත්තර පොත " ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න,

1. ප්‍රශ්නෝත්තර පොත සකස් කිරීමේදී ඔබ යොදාගත් පෙළ පොතේ පාඩම් දෙකක් නම් කරන්න. ( ලකුණු 02 )
2. මෙම පොත සකස් කිරීම පිළිබඳ ගුරුතුමාගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. ( ලකුණු 02 )
3. ප්‍රශ්නෝත්තර පොතේ මුල් පිටුවේ සඳහන් කළ කරුණු දෙකක් ලියන්න. ( ලකුණු 02 )
4. මත්ද්‍රව්‍ය සඳහා යොමු වුවන්ට සිදු වන හානි තුනක් ලියන්න. ( ලකුණු 03 )
5. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් ස්වාමියා විසින් භාර්යාවට ඉටුකළ යුතු යුතුකම් තුනක් ලියන්න. ( ලකුණු 03 )
6. ප්‍රශ්නෝත්තර පොත සකස් කිරීමේදී ඔබට ඇතිවූ ගැටළු දෙකක් ලියන්න. ( ලකුණු 02 )
7. මෙම ඇගයීම තුළින් ඔබ ලැබූ අත්දැකීම් දෙකක් ලියන්න. ( ලකුණු 02 )

02)
1. බුදුරජාණන් වහන්සේ ගැටලු වලට මුහුණ දුන් අවස්ථා තුනක් නම් කරන්න. ( ලකුණු 03 )
2. අෂ්ඨ ගරු ධර්ම අතුරින් තුනක් ලියන්න. ( ලකුණු 03 )
3. කාන්තාවන්ට පැවිද්ද ලබා දීම සිදු වූ ආකාරය කෙටියෙන් ලියන්න. ( ලකුණු 05 )

03)
1. " යේ ධම්මා හේතුප්පභවා " ගාථාව ලියන්න. ( ලකුණු 03 )
2. මෙම ගාථාව ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් කා හටද? ( ලකුණු 03 )
3. සැරියුත්, මුගලන් අග්‍රශ්‍රාවකයන් වහන්සේලා දෙනමගේ චරිත දෙකෙන් අපේ ජීවිතයට ලබාගත හැකි ආදර්ශ පහක් ලියන්න. ( ලකුණු 05 )

04) 1. " සේබියා " යන පදය සඳහා භාවිතා කෙරෙන වෙනත් වචන තුනක් ලියන්න. ( ලකුණු 03 )

2. බුද්ධ දේශනාවට අනුව ඇඳුම් ඇඳීමේ පරමාර්ථ තුනක් ලියන්න. ( ලකුණු 03 )

3. සංවර ඇඳුම ගමන හා ආහාර රටා නිසා ඔබේ පෞරුෂයට වන වාසි පැහැදිලි කරන්න ( ලකුණු 05 )

05) 1. සදිසා නමස්කාරය පිලිබඳ සඳහන් කරමින් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍ර ධර්මය කුමක්ද? ( ලකුණු 03 )

2. සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න ( ලකුණු 03 )

3. යහපත් හිත මිතුරු සබඳතාව ශිෂ්‍ය ජීවිතයේ සාර්ථකත්වයට හේතු වන ආකාරය විස්තර කරන්න. ( ලකුණු 05 )

06) 1. පංචස්කන්ධය අතරින් කොටස් තුනක් නම් කරන්න. ( ලකුණු 03 )

2. පුරාණාචාර්යවරු උගන්වා ඇති පරිදි දුක්ඛ සත්‍යය පිළිබඳ ආකාර තුන සඳහන් කරන්න ( ලකුණු 03 )

3. තණ්හාව දුකට හේතු වන අයුරු පැහැදිලි කරන්න. ( ලකුණු 05 )

07) 1. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න. ( ලකුණු 11 )

1 දෙව්දත් තෙරුන්ගේ පංචවරය
2 බුද්ධ චරිතයෙන් පිළිබිඹුවන ආචාරශීලි ගුණාංග
3 අවමංගල්‍ය චාරිත්‍ර
4 බුද්ධානුස්සති භාවනාව
5 අංගුලිමාල රහතන් වහන්සේ